**Part 03**

unit 04

# ආණ්ඩුවේ ස්වභාවය

වාගීෂ්වර

## 4.3 ආණ්ඩුක්‍රම ආකෘතීන්

- දේශපාලන න්‍යාය (මතවාද) අනුව
- බලය බෙදීම අනුව
- විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව

sureka wageeshwara

# ආණ්ඩුක්‍රම ආකෘතීන්

# ආණ්ඩුක්‍රම ආකෘතීන්

• <u>ආණ්ඩුක්‍රම ආකෘතීන් වර්ග කිරීමේ පදනම.</u>

නූතන ජාතික රාජ්‍යයන් තුළ විවිධ ආණ්ඩුක්‍රම ආකෘතීන් ක්‍රියාත්මක වීම ලක්ෂණයකි. එම ආකෘතීන් ප්‍රධාන තේමා තුනකට බණ්ඩනය කළ හැකිය.

1. දේශපාලන මතවාද (න්‍යාය) අනුව.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදාහැර ඇති ආකාරය අනුව.
3. විධායක බලය ක්‍රියාවට නංවන ආයතනයේ ස්වරූපය අනුව.




මෙම ආණ්ඩුක්‍රම ආකෘතීන් අධ්‍යයනය කිරීමේ දී,

ආණ්ඩුක්‍රම ආකෘතිය හඳුනාගැනීම,

ආණ්ඩුක්‍රම ආකෘතියට අදාළ නිදර්ශන,

ආණ්ඩුක්‍රම ආකෘතියේ ලක්ෂණ,

ආණ්ඩුක්‍රම ආකෘතියේ වාසි අවාසි,

සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය.

## දේශපාන න්‍යාය (මතවාද) අනුව

නූතන ජාතික රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම දේශපාලන න්‍යාය මත ප්‍රධාන කොටස් කිහිපයකට වර්ග කළ හැකිය.

1. **ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම.**
2. **සමාජවාදී ආණ්ඩුක්‍රම.**
3. **ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රම.**
4. **සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම.**

## ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම

- <u>ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යාය මත ගොඩනගා ඇති ආණ්ඩුක්‍රම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම වේ. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වන්නේ ධනේශ්වර අර්ථක්‍රමයක් තුළය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ දේශපාලන - සමාජීය - ආර්ථික - සංස්කෘතික ආදී අංශයන් හි නිදහස පුද්ගලයා භුක්තිවිඳී.

- <u>ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකට අදාල නිදර්ශන.</u>

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය මුලින්ම නිර්මාණය වන්නේ **I වන ලෝකයේ රාජ්‍යයන් තුළය. එංගලන්තය - ප්‍රංශය - ඇමරිකාව** මීට අදාළ ශක්තිමත් නිදර්ශනයන්ය.

- <u>ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.</u>

(i) **මහජන ස්වාධිපතිත්වය.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ක්‍රියාත්මක වන රාජ්‍යයන්හි ස්වාධිපත්‍යය ජනතාව සතුය. ජනතාව සතු පරමාධිපත්‍යය බලය කිසියම් කාල සීමාවකට ආණ්ඩුවට පවරයි. මහජන පරමාධිපත්‍යයෙන් පත් වූ ආණ්ඩු ඉවත් කිරීමට පෙරලා දැමීමට ජනතාවට හැකිය.

(ii) **සමානාත්මතාවය.**
**(N.B ප්‍රජාතන්ත්‍රවාදය Tute එක අධ්‍යයනය කරන්න.)**

සමානාත්මතාවය යන්නෙන් සංකේතවත් වන්නේ අයිතිවාසිකම් බුක්ති විඳීමට ඇති සමාන ඉඩ ප්‍රස්ථාවයි. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක සමානාත්මතාවය ඉතා ඉහළින් පිළිගනී.

නිදර්ශන - 1776 ඇමරිකානු නිදහස් ප්‍රඥප්තියේ දී **"සෑම මිනිසෙක්ම සමාන අයිතිවාසිකම් සහිතව මවන ලද බව අපි හැම දෙනාම පිළිගනිමු."** යැයි දක්වා තිබේ.

1789 ප්‍රංශයේ ජාතික මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කළ පනත මගින් **"මිනිසා උපතේ සිට මරණය දක්වාම සමාන අයිතිවාසිකම් උරුම කොට ගත්තෙකි."** දැක්වා තිබීම.

(iii) **අයිතිවාසිකම්.**
**(N.B ප්‍රජාතන්ත්‍රවාදය Tute එක අධ්‍යයනය කරන්න.)**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක තවත් ලක්ෂණයක් වන්නේ පුද්ගලයාට අයිතිවාසිකම් හිමි කර දීමයි. **දේශපාලන අයිතිවාසිකම් - ආර්ථික අයිතිවාසිකම් - සාමාජීය අයිතිවාසිකම්** පුද්ගලයාට හිමි වීම ලක්ෂණයකි.

**අයිතිවාසිකම්**

| **සාමාජයීය අයිතිවාසිකම්** | **දේශපාලන අයිතිවාසිකම්** | **ආර්ථික අයිතිවාසිකම්** |
|---|---|---|
| ජීවත් වීමේ අයිතිය | ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය | රැකියාවක් කිරීමේ අයිතිය |
| භාෂණයේ අයිතිය | දේශපාලන පක්ෂ නිර්මාණය කිරීමේ අයිතිය | රැකියාවක් නොකිරීමේ අයිතිය |
| ප්‍රකාශනයේ අයිතිය | කැමති දේශපාලන මත වාදයක් දැරීමේ අයිතිය | දේපළ රැස්කර ගැනීමේ අයිතිය |

(iv) **නියෝජන ආණ්ඩුක්‍රම.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වේ. එනම්, ජනතා නියෝජිතයින් හරහා පාලන කටයුතු සිදුකරයි. එම නිසා නියෝජිත ආණ්ඩු පවතී. ජනතාව නියෝජිතයින් තෝරා පත් කරනවාක් මෙන්ම එම නියෝජිතයින් ඉවත් කිරීමට ද ජනතාවට හැකිය.

(v) **ව්‍යවස්ථානුකූල ආණ්ඩු.**
**(N.B ව්‍යවස්ථානුකූල වාදය හා බැඳේ.)**

ව්‍යවස්ථානුකූල ආණ්ඩු යන්නෙන් අදහස් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව ගොඩ නගන ලද ආණ්ඩුක්‍රමයක් ය. මෙහිදී පාලන කටයුතු සිදු කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවයි. ව්‍යවස්ථානුකූල වාදය - ව්‍යවස්ථානුකූල භක්තිය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ පවතින ලක්ෂණයන්ය.

(vi) **කාලීනව පවත් වන නිදහස්, රහස්, තරඟකාරී, සාධාරණ මැතිවරණ.**

නියෝජිතයින් තෝරා ගැනීම සඳහා නිශ්චිත කාලයකට පසු නිදහස් රහස් තරඟකාරී සාධාරණ මැතිවරණ පැවැත්වීම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණයකි.

(vii) **වගකීම් සහිත ආණ්ඩු.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක පවතින ආණ්ඩු වගකීම් සහිත ආණ්ඩු වේ. විශේෂයෙන් මෙම ක්‍රමය තුළ නිර්මාණය වන්නේ මහජනතාවට වගකියන ආණ්ඩුය.

(viii) **නීතියේ ආධිපතිත්වය.**
**(N.B ප්‍රජාතන්ත්‍රවාදය Tute එක අධ්‍යයනය කරන්න.)**

නීතියේ ආධිපත්‍යය (නීතියේ බලය) , පාලකයා මෙන්ම පාලිතයා ද නීතිය ඉදිරියේ එක සමාන වීම මින් සංකේතවත් වේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ජනතාවත්, පාලකයාත් නීතියට අනුකූලව කටයුතු කළ යුතු බව මින් අර්ථවත් වේ. මෙම ලක්ෂණය ද ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණයකි.

(ix) **අධිකරණයේ ස්වාධීනත්වය.**

අධිකරණයේ ස්වාධීනත්වය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක තවත් වැදගත් ලක්ෂණයකි. විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ බලපෑමකින් - මැදිහත් වීමකින් - ඇඟිලි ගැසීමකින් තොරව අධිකරණයට නීති විනිශ්චය කිරීමට ඇති හැකියාව ඉන් අර්ථවත් වේ. අධිකරණයේ ස්වාධීනත්වය සමාජයක සාධාරණත්වය මනින දර්ශකයක් වේ.

(x) **තරඟකාරී දේශපාලන පක්ෂ ක්‍රමයක් පැවතීම.**
**(N.B දේශපාලන ක්‍රියාදාමය Tute එක අධ්‍යයනය කරන්න.)**

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන නිසා නියෝජිතයින්ට මැතිවරණ සඳහා ඉදිරිපත් වීමට දේශපාලන පක්ෂ අවශ්‍ය වේ. එම නිසා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් තුළ තරඟකාරී බහු පක්ෂ ක්‍රමයක් පවතී.

(xi) **බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වය.**
**(N.B දේශපාලන ක්‍රියාදාමය Tute එක අධ්‍යයනය කරන්න.)**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක නිදහස් බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකාරීත්වයට අවකාශය පවතී. ආණ්ඩුවට බලපෑම් කිරීම, ජනතාවට හිමි මූලික අයිතියක් ලෙස මෙම ආණ්ඩුක්‍රම තුළ පිළිගැනීම. එම නිසා මෙම ආණ්ඩුක්‍රම තුළ නිදහස් බලපෑම් කණ්ඩායම් වල සක්‍රීය ක්‍රියාකාරීත්වයක් හඳුනාගත හැකිය.

(xii) **නිදහස් ජනමාධ්‍යයක් පැවතීම.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක නිදහස් ජනමාධ්‍යයක් පවතී. විශේෂයෙන් ප්‍රකාශනයේ නිදහස - භාෂණයේ නිදහස රාජ්‍යය මර්ධනයකින් තොරව ජනතාව භුක්තිවිඳී.

(xiii) **සමාජ බහුවිධතාවය පිළිගැනීම.**

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක සමාජ බහුවිධතාවය පිළිගනී. එනම්, බහුවාර්ගික - බහු වාර්ණික - බහු ආගමික - බහු භාෂාමය - බහු සංස්කෘතික සමාජ ක්‍රමයන්ට මෙවැනි ආණ්ඩුක්‍රමයක් තුළ සාමකාමීව පැවතීමේ ඉඩ පවතී. ජාතිවාදය - වර්ගවාදය - ආගම් වාදය - කුල වාදය ලිබරල් ක්‍රමයක් තුළ දේශපාලනික අවභාවිතාවන්ට භාවිත නොකරයි.

(xiv) **යහපාලනය.**
(xv) **නිදහස් මහජන මතයක් පැවතීම.**
(xvi) **පාලකයින්ගේ සහ පාලිතයන්ගේ ප්‍රජාතාන්ත්‍රික දේශපාලන චර්යා.**

• <u>ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ මහජන කැමැත්තට මුල් තැන ලබා දීම.<br>○ විකල්ප දේශපාලන මත දැරීමට අවකාශය පැවතීම.<br>○ මහජන සුබසාධනය.<br>○ ජනතාවට නිදහස හිමිවීම.<br>○ ජනතාවට අයිතිවාසිකම් හිමිවීම.<br>○ අධිකරණය ස්වාධීනවීම.<br>○ පාලකයන් ජනතාවට වගකිව යුතු වීම.<br>○ ජනතාව පාලකයා තෝරා ගැනීම.<br>○ පුද්ගලයා වැදගත් කොට සැලකීම. | ○ මෝඩයන්ගෙන් සමන්විත පාලන ක්‍රමයක් ලෙස ෆැසිස්ට්වාදීන් විග්‍රහ කිරීම.<br>○ ගුණයට වඩා ප්‍රමාණය උසස් කොට සැලකීම.<br>○ ස්ථාවර ආණ්ඩු ඇති වීමට බාධාවීම.<br>○ නිරන්තරව ධනවාදයට මඟ සලසන ක්‍රමයක් වීම.<br>○ බහුතර පාලනය සෑම විටම නිවැරදි නොවිය හැකි වීම.<br>○ කාර්යක්ෂම තාවයෙන් අඩු විය හැකි වීම. |

**සමාජවාදී ආණ්ඩුක්‍රම**

• <u>සමාජවාදී ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

මාක්ස්වාදී න්‍යාය මත ගොඩනැගුණු ආණ්ඩුක්‍රම සමාජවාදී ආණ්ඩුක්‍රම වේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, **විද්‍යාත්මක සමාජවාදය - මාක්ස් ලෙනින්වාදය - මාක්ස් එංගල්ස්වාදී** දේශපාලන දෘෂ්ටිවාද මත නිර්මාණ වූ ආණ්ඩුක්‍රම සමාජ වාදී ආණ්ඩුක්‍රම වේ. සමාජවාදී ආණ්ඩුක්‍රම නිර්මාණය වන්නේ සමාජවාදී විප්ලවයකින් අනතුරුවය. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය උදාකර ගැනීමයි.

• <u>සමාජවාදී ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

සමාජවාදී ආණ්ඩුක්‍රම නිර්මාණය වන්නේ **II වන ලෝකයේ රාජ්‍යයන් තුළය.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම යන්ට ප්‍රතිවිරෝධ ව්‍යාපාරයක් ලෙස මෙම ආණ්ඩුක්‍රම උත්පාද වේ. ප්‍රථම සමාජවාදී ආණ්ඩුක්‍රම වන්නේ **1917 දී වී.අයි. ලෙනින් විසින් නිර්මාණය කළ සෝවියට් රුසියානු ආණ්ඩුක්‍රමයයි.** ඉන් අනතුරුව **මාඕ සේතුං යටතේ චීනය - ෆිදෙල් කැස්ත්‍රෝ යටතේ කියුබාව ද සමාජවාදී ආණ්ඩු** බවට පත් විය. තවදුරටත්, **රුමේනියාව - පෝලන්තය - බල්ගේරියාව - චෙකොස්ලෝවැකියාව - යුගොස්ලෝවැකියාව** සමාජ වාදී ආණ්ඩුක්‍රමවලට නිදර්ශන වේ.

- <u>සමාජවාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.</u>

(i) **ඒක පක්ෂ පාලන ක්‍රමය සහ පක්ෂයේ ආධිපතිත්වය.**

සමාජවාදී ආණ්ඩුක්‍රමයක් සතු මූලික ලක්ෂණයක් වන්නේ ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වීම සහ එම පක්ෂයේ ආධිපතිත්වයක් පැවතීමයි. කොමියුනිස්ට් සමාජය උදාකරගැනීමේ අරමුණ පමණක් ඇති නිසා එක් දේශපාලන පක්ෂයක් පවතී. බහු පක්ෂ ක්‍රමය ප්‍රතික්ෂේප කරයි. සමාජ බහුවිධතාවය ප්‍රතික්ෂප කරයි. නිදර්ශන ලෙස පැවති **සෝවියට් රුසියානු සමූහාණ්ඩුවේ කොමියුනිස්ට් පක්ෂය** දැක්විය හැකිය.

(ii) **කොමියුනිස්ට් මූලධර්ම පදනම් කර ගනිමින් ආණ්ඩුවේ ව්‍යූහයන් හා කාර්යයන් විභේදනය කර තිබීම.**

(iii) **මධ්‍යගත සැලසුම් කරණය.**

සමාජවාදී ආණ්ඩුක්‍රමයක දැක ගත හැකි තවත් ලක්ෂණයක් වන්නේ මධ්‍යගත සැලසුම් කරණයයි. ලිබරල් ක්‍රමයක මෙන් නිදහස් වෙළෙඳ පොළ ක්‍රමයක් - නිදහස් ව්‍යවසාය ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ. රාජ්‍යය විසින් සෘජුව ආර්ථිකය පාලනය කරනු ලබයි. පෞද්ගලික ආයෝජන ව්‍යාපාර දිරිගැන්වීමක් නොමැත. රටට අවශ්‍යය භාණ්ඩ සේවා මධ්‍යගත සැලසුම් ක්‍රමයක් මත තීරණය කරයි.

(iv) **ආර්ථික සමානාත්මතාව.**

සමාජවාදී ආණ්ඩුක්‍රමයක මූලිකත්වය ලබා දෙන්නේ ආර්ථික අයිතිවාසිකම් වලට. ආර්ථික සමානාත්මතාවය තුලින් දේශපාලන හා සමාජීය සමානාත්මතාවය ඇති කිරීම සම්බන්ධයෙන් විශ්වාස කරයි.

(v) **කොමියුනිස්ට් මූලධර්ම අනුව ජනතාවගේ දේශපාලන - ආර්ථික හා සාමාජීය ජීවිත පාලනය කිරීම.**

(vi) **කේවල පුද්ගලයාගේ යහපත සම්බන්ධයෙන් නොව සමස්ත සමාජයේ යහපත වෙනුවෙන් ආණ්ඩුව ක්‍රියාත්මක වීම.**

(vii) **ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව ජනතාවගේ නිදහස සීමා වීම.**

- <u>සමාජවාදී ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ ආර්ථික සමානාත්මතාවය ඇති කිරීමට උත්සාහ දැරීම.<br>○ තරඟකාරී මැතිවරණ නොමැති නිසා මැතිවරණ දූෂණ, අක්‍රමිකතා, ගැටුම් අවම වීම. | ○ සමාජබහුවිධතාවය පිළිනොගැනීම.<br>○ දේශපාලන අයිතීන් සීමා වීම.<br>○ සාමාජීය අයිතීන් සීමා වීම. |

## ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රම.

● <u>ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ෆැසිස්ට්වාදී දේශපාලන ව්‍යාපාරය මත ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රම වේ. මෙම ආණ්ඩුක්‍රම හිංසාකාරී - පීඩාකාරී - අත්තනෝමතික ආණ්ඩුක්‍රමයක් ලෙස විග්‍රහ කළ හැකිය.

● <u>ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයන්හි ආරම්භය වන්නේ **ඉතාලියේ බෙනිටෝ මුසෝලිනී යටතේ පැවති ආණ්ඩුක්‍රමයයි. ජර්මනියේ - හිට්ලර් යටතේ, උගන්ඩාවේ - ඉඩිඅමීන් යටතේ කාම්බෝජයේ - පොල්පොට් යටතේ, පිලිපීනයේ - මාකෝස් යටතේ , ජපානයේ - හිරෝහිතෝ අධිරාජ්‍යයා** යටතේ, පැවති ආණ්ඩු ෆැසිස්ට්වාදී ආණ්ඩුවලට නිදර්ශනයන්ය.

● <u>ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.</u>

(i) **ආණ්ඩුවේ කාර්යයන් කාර්යාත්මක හා පුද්ගලානුබද්ධ වශයෙන් බෙදා නොතිබීම.**

ආණ්ඩුවේ කාර්යයන් විධිමත්ව බෙදා නොතිබීම ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයයි. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන ත්‍රිවිධ අංශ සතු බලතල එක් පුද්ගලයකු විසින් ක්‍රියාත්මක කිරීම මෙහි ලක්ෂණයකි.

(ii) **රාජ්‍යයේ උත්තරීතරික භාවය.**

ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයක රාජ්‍යය අති උත්තරීතර භාවයට පත් කරයි. මෙහි පුද්ගලයා එතරම් වැදගත් නැත. රාජ්‍යයේ පැවැත්ම හා උත්තරීතර භාවය පමණක් වැදගත් වේ. රාජ්‍යයේ උත්තරීතරිකභාවය ෆැසිස්ට් විග්‍රහයන් තුලින් සනාථ වේ. <u>ටියට්‍රියන්ගේ</u> විග්‍රහය එවැන්නකි.

**"පුද්ගලයා බිම වැටී දන නමා රාජ්‍යයට නමස්කාර කල යුතුය. සියළු පෞද්ගලික මෙන්ම පොදු කටයුතු වලදී මූලිකත්වය ගත යුත්තේ රාජ්‍යයයි. එහෙයින් රාජ්‍යයට පිටස්තරව කිසිඳු පුද්ගලයෙකුට හෝ සංවිදානයකට පැවැත්මක් නැත"**

- ටියට්‍රින් -

(iii) **උග්‍ර ජාතිවාදය (ජාතිවාදී උමතුව).**

ශුද්ධත්වය හෙවත් ''ආර්ය සංකල්පය'' ෆැසිස්ට්වාදී ව්‍යාපාරය තුළ බොහෝවිට මුල්බැස ගත් එකකි. උග්‍ර ජාතිවාදය එහිම උත්පාදයකි. මෙහිදී එක් ජන වර්ගයක ශ්‍රේෂ්ඨ බව අවධාරණය කරමින් එම ජන වර්ගය අනිත් ජනවර්ග වලට වඩා ශ්‍රේෂ්ඨ ශුද්ධ වූ ''**ආර්ය ලේ සහිත**'' ජාතියක් යන දෘඪ හැඟිම සමාජ ගත කිරීම ෆැසිස්ට් වාදය තුළ බොහෝ විට සිදුවේ. <u>ජර්මනිය තුළ හිට්ලර්ගේ නාසි ව්‍යාපාරය තුළ ජර්මානුවන් ශ්‍රේෂ්ඨත්වයට සහ ශුද්ධත්වයට පත් කරමින් සිදු කරන ලද යුදෙව් සංහාරය මීට අදාල ප්‍රධාන නිදර්ශනයකි.</u>

(iv) **අධි යුදකාමය (රණපරම වාදය/රණකාමය).**

ෆැසිස්ට් ආණ්ඩුක්‍රම සැම විටම යුධකාමය අගය කළේ ය. එය ෆැසිස්ට්වාදයට අදාල සියල් සීමා උදාහරණ තුළ හමුවන ප්‍රකාශයන්ගෙන්ද ප්‍රායෝගික භාවිතාවන්ගෙන්ද යළි යළිත් සනාථ වේ.

මුසෝලනිට අනුව :

**"මිනිසාට යද්ධය වූ කලී ස්ත්‍රියට මාතෘත්වය හා සමාන ස්වාභාවික දෙයක් වේ. සාමය මගින් මිනසාගේ සෑම ස්වාභාවික ගුණාංගයක්ම යටපත් කරනු ලැබේ. මුළු මහත් ජනතාවම ආයුද සන්නද්ධ කොට යුද්ධ කිරිමට පුහුණු කිරිම රාජ්‍යයේ ප්‍රධාන වගකීම වේ"**

**"ප්‍රජාතන්ත්‍රවාදයට අවුරුදු 48 ක් තුළ කිරීමට නොහැකි වූ කාර්යන් අපි පැය 48 ක් තුළදී කඩුවේ හා තුවක්කුවේ බලයෙන් ඉටුකර ගත්තෙමු"**

හිට්ලර් ට අනුව :

**"ජීවත් වන සැම අයෙක්ම යුද්ධ කළ යුතුය. සටන් කිරීමට අකමැති අයෙකුට ජීවත් වීමට අයිතියක් නොමැත්තේය. මනුෂ්‍යත්වය පරිපූර්ණ වන්නේ මිනිසා යුද්ධ කළහොත් පමණි. යුදධය වූ කලී මිනිස් ජීවිතය හා සම්බන්ධ ස්වාභාවික ක්‍රියාවක් වේ."**

**"ගැහැනියට මාතෘත්වය යම් සේ වැදගත් ද පුරුෂයාට සටන්කාමීත්වය එතරම් වැදගත් වේ. පුරුෂයා වැඩ බිමේදී එනම් කුඹුරේදී හෝ කම්හලේ දී සිය අත තුවක්කුවක් නැතත් තුවක්කුවක් ඇති බව සිතාගත යුතුය"**

<u>පොදුවේ ගත් කල ෆැසිස්ට්වාදීන් යළි යළිත් යුද්ධයේ වැදගත් කම අවධාරණය කළේය.</u>

- ⋆ හිංසාව උතුම් දෙයක් ලෙසත් අවිහිංසාව බියගුලු කමක් ලෙසත් ප්‍රකාශ කරයි.
- ⋆ සාමය සාකච්ඡාවන් බැහැර කරයි. ලෝකයට සාමයෙන් වූ සේවයට වඩා දහස් ගුණයක සේවාවක් යුද්ධයෙන් වූ බව විශ්වාස කරයි.
- ⋆ ලෝකය ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත්තේ යුද්ධ කිරීම නිසාය. යුද්ධය නිසා ශ්‍රේෂ්ඨ නායකයන් බිහිවේ. බියගුල්ලන් කුසීතයන් විනාශ වේ.
- ⋆ මොවුන් අන්තර්ජාතික සහයෝගිතාව අනතර්ජාතික සාමය බියගුලු කමක් ලෙස සැලකීමයි.

(v) **පුද්ගලයා අර්ථ ශූන්‍ය වීම.**

ෆැසිස්ට් ආණ්ඩුක්‍රමයක පුද්ගලයා වැදගත් නොවන අර්ථ ශූන්‍ය දෙයක් වේ. පහත ෆැසිස්ට් ප්‍රකාශන මගින් එය තහවුරු වේ.

**"කොළ වියලී ගියද ගස ජීවත් වේ".**

**"මිනිසුන් ඉපදෙති, වැඩෙති , මියෙති ඔවුන් වෙනුවට වෙනත් මිනිසුන් නැවත උපදිති එසේ මිනිසුන් විනාශ වුවත් රාජ්‍යය හා සමාජය විනාශ නොවේ. එය සදාකාලිකව පවතින දෙයකි."**

(vi) **බුද්ධි විරෝධී භාවය (අතාර්කික භාවය)**

බුද්ධි විරෝධී බව ෆැසිස්ට් ආණ්ඩුක්‍රමයක් තුළ පදනම් ලක්ෂණයකි. එය ෆැසිස්ට් වාදයට අදාල සියළුම ලක්ෂණත් තුළින් ගම්‍ය වේ.

ෆැසිස්ට්වාදය සෘජුවේම බුද්ධි විරෝධීභාවය ස්වකීය පැවැත්ම සඳහා පාදක කර ගත් බව **හිට්ලර්** ගේ **"මගේ සටන"** නැමති කෘතිය සාක්ෂි දරයි. ෆැසිස්ට්වාදය තුළ ප්‍රචාරණයන්ගේ ස්වභාවය හැඩ ගැස්විය යුතු ආකාරය පිළිබඳ හිට්ලර් ගේ විග්‍රහය, සත්‍ය වෙනුවට ජනප්‍රිය වාදය සහ වංචනික බව පදනම් කරගත් ෆැසිස්ට් බුද්ධි විරෝධය සනාථ කරයි.

**"මිනිසුන් අතර ජනප්‍රිය කුමක්ද යන්න සොයා බලා එය ප්‍රචාරනය කළ යුතුය. ප්‍රචාරණය සඳහා එල්ලවන පුද්ගල කණ්ඩායමේ බුද්ධි මට්ටමට හා සිතැගියනට ගැලපෙන අයුරින් ප්‍රචාරනය සකස් කලයුතුය. ඉලක්ක කර ගත් පුද්ගල කණ්ඩායමේ මනසට ඉතාම ගැඹුරින් කාවදින අයුරින් ආරාධනා කිරීමට ප්‍රචාරනය සමන්විය යුතුය. ප්‍රචාරණයකදී විශේෂයෙන් මතක තබාගත යුතු දෙයක් වන්නේ කරුණු තර්කානුකූලව සහ බුද්ධිමත්ව අවබෝධ කර ගැනිමට සාමන්‍ය ජනතාවට ඇති හැකියාව අතිශයින්ම සීමිත වන බව සහ කරුණු ඉතාම ඉක්මනින් අමතක වීම ඉතා ඉහළ මට්ටමක පවතින බවයි. එම නිසා මිනිසුන්ගේ සංවේදිතාවයන් සොයා බලා ඔවුන්ගේ හැඟීම් ඇවිස්සෙන ආකාරයට ආයාචනා කරමින් ඔවුන් තමන් වෙත නම්මවා ගැනීමට සමත් අයුරින් ප්‍රචාරණය කළ යුතුය."**

**- හිට්ලර් (මගේ සටන) -**

මෙපරිදිව ෆැසිස්ට්වාදය බුද්ධි විරෝධය සෘජුවේම ප්‍රධාන පැවතුම් යාන්ත්‍රනයක් ලෙසින් භාවිත කළේය.

(vii) **නායකත්වය වන්දනීය බවට පත් කිරීම.**

නායකත්වය අභිවන්දනයට පත් කරමින් එය අන්ධානුකරණ ක්‍රියාදාමයක් තුළ නායකයා උත්තරීතරත්වය කරා රැගෙනයාම ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයකට අදාල තවත් පදනම් ලක්ෂණයකි. එය ෆැසිස්ට්වාදයේ සියළුම ප්‍රායෝගික භාවිතාවන් තුළ යළි යළිත් සනාථ වන සත්‍යයක් වේ.

- ★ පාලකයා සමාජයේ ප්‍රථම පුරවැසියා මෙන්ම ශ්‍රේෂ්ඨ පුරවැසියා වීම.
- ★ නායකයා පත් කිරීමට බලයක් ජනතාවට නොමැති වීම සහ තමා විසින්ම නායකත්වයට පත් වීම.
- ★ නායකයා ජනතාවට වග නොකියන අතර ජනතාව නායකයාට වගකිවයුතු වේ.
- ★ නායකයා ජාතියේ ප්‍රතිමූර්තිය වේ. නායකයාට ප්‍රශ්න කිරීමකින් තොරව යටත් වීම ගෞරව කිරීම.

**මුසෝලනිගේ පාලනය තුළ ඔහුගේ නායකත්ව** පෞරුෂය ඉතාලියානුවන් තුළ දෘඩ ලෙස කාවැද්දීමට භාවිතා කළ ප්‍රචාරණ ආයාචනාව මීට කදිම නිදසුනකි.

**"මුසෝලනි කෙරෙහි විශ්වාසය තබන්න. ඔහුට කීකරු වන්න. ඔහු වෙනුවෙන් සටන් කරන්න. ඔහු හැම විටම නිවැරදි වේ."**

සෑම උදෑසනක සිටම ජර්මනිය පුරා ගුවන් විදුලි විකාශනයන් තුළ සහ මංමාවත් හි ගිය ප්‍රචාරන රථයන් තුළ විකාශනය වූයේ ,

**" හිට්ලර් ජර්මනියේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වේ.යහපත් ම පුද්ගලයා වේග බුද්ධිමත්ම පුද්ගලයා වේ. අසහාය ගැලවුම්කරුවා වේ. ඔහු කථා කරන්නේ නැත. දේශනා කරයි. ඔහු සාකච්ඡා කරනු නොලැබේ. අවසාන තීන්දුව ප්‍රකාශයට පත් කරයි. ඔහු ඇවිදින්නේ නැත. ජර්මන් ජාතිය ශ්‍රේෂ්ඨත්වය කරා මෙහෙයවයි "**

(viii) **අන්තර්ජාතික සාමය සහයෝගීතාවය ප්‍රතික්ෂේප කිරීම.**

ෆැසිස්ට්වාදීන් විසින් අන්තර්ජාතික සාමය හා සහයෝගීතාවය ප්‍රතික්ෂේප කරයි. එය බියගුලු කමක් ලෙස අර්තකථනය කරයි.

(ix) **ඒක පක්ෂ ක්‍රමය.**

ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රමයක් තුළ ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර ප්‍රජාතන්ත්‍රිවාදී ආණ්ඩුක්‍රමයක් තුළ බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. තවදුරටත් මෙය විග්‍රහ කරනුයේ නම් ෆැසිස්ට් ක්‍රමයක් තුළ බලහත්කාරයෙන් සමාජ ගත කරන ලද ඒකපක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ නිදහස් බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. ඇතැම් විට මතුපිට තලය තුළ ෆැසිස්ට් ක්‍රමයක් තුළ බහු පක්ෂ ක්‍රමයක් පවතින බව පෙනුනද එය බොහෝ විට මිලින වී ගිය නැත්නම් මියදුණු බහු පක්ෂ ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය.

(x) **යුතුකම් පමණක් අවධාරණය කරමින් අයිතිවාසිකම් කප්පාදු කිරීම.**

මෙම ආණ්ඩුක්‍රම තුළ පුද්ගලයාට අයිතිවාසිකම් හිමි නොවේ. ඇත්තේ යුතුකම් පමණි. ඒ රාජ්‍යයට අවනත වීමයි. රාජ්‍යයට අවනත වූ තරමට පුද්ගලයාට යහපත උදා වේ.

(xi) **අසීමාන්තික ව්‍යාප්ත වාදය.**

ෆැසිස්ට් ආබ්ඩුක්‍රමයක් තුළ පවතින තවත් ලක්ෂණයක් වන්නේ ව්‍යාප්තවාදයයි. ෆැසිස්ට්වාදයේ ව්‍යාප්තික සීමාවන් ඔවුන් තම ආරම්භක පරිසරය තුළ පමණක් රඳවා ගැනීමට අකමැතිය. ෆැසිස්ට් ව්‍යාප්ත වාදය ප්‍රධාන කොටස් දෙකකට බණ්ඩනය කළ හැකිය.

- **මතවාදී ව්‍යාප්ත වාදය**
- **භූගෝලීය ව්‍යාප්ත වාදය**

<u>මතවාදී ව්‍යාප්ත වාදය</u> ෆැසිස්ට්වාදය තුළ දෘඪ බුද්ධි විරෝධී ප්‍රචාරණයන් හරහා අසීමාන්තිකව ව්‍යාප්ත කිරීමට කටයුතු කරන අතර භූගෝලීය ව්‍යාප්ත වාදය සඳහා රණපරම වාදය හෙවත් යුද්ධය ක්‍රියාවට නගයි. ජර්මනියේ බලය තහවුරු කරගත් හිට්ලර් ඉන් නොනැවතී <u>පෝලන්තය</u> සහ අසල්වැසි සියලු රාජ්‍යයන් භූගෝලීය ව්‍යාප්තවාදයට අවනත කර ගන්නා අතර <u>එය බිඳවැටෙන්නේ රුසියාව තුළය</u>.

(xii) **ප්‍රායෝගික සමානාත්මතාවය බිඳ දැමීම.**

ෆැසිස්ට්වාදී ආණ්ඩුක්‍රම ප්‍රායෝගික සමානාත්මතාව ප්‍රතික්ෂේප කරයි. එමෙන්ම ස්ත්‍රිය පිළිබඳ පුරුෂ මූලික ෆැසිස්ට්වාදී ප්‍රවේශයද ප්‍රායෝගික සමානාත්මතාවය බිඳ දැමීමකි.

**"ස්වභාවයෙන් ම පිරිමි ස්ත්‍රියට වඩා උසස් වේ. යුද්ධයේදී වටිනා සාධකය පුරුෂයන් වීම ඊට ප්‍රධාන හේතුවයි"**

-හිට්ලර්-

(xiii) **නීතියේ ආධිපත්‍යය බිඳ දැමීම.**

(xiv) **ආණ්ඩු විවේචනයට ඉඩ නොමැති වීම.**

(xv) **ජනමාධ්‍යය නිදහස හකුළුවා ලීම.**

(xvi) **බලපෑම් කණ්ඩායම් වලට පැවතීමට ඉඩ නොමැති වීම.**

(xvii) **පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා පාර්ලිමේන්තුව උපහාසයට ලක් කිරීම.**

**"පාර්ලිමේන්තුව වූ කලී කිසිවක් හරිහැටි කිරීමට නොදත් මෝඩයින්ගෙන් සමන්විත සාප්පුවකි"**

● <u>ෆැසිස්ට් ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ ශක්තිමත් හා ස්ථාවර ආණ්ඩු නිර්මාණය වීම.<br>○ ආණ්ඩුවේ කාර්යක්ෂමතාවය වැඩිවීම. | ○ ජනතාවට නිදහස නොමැති වීම.<br>○ ජනතාවට අයිතිවාසිකම් නොමැති වීම.<br>○ නීතිය සාධාරණ නොවීම.<br>○ ජාතිවාදය ක්‍රියාත්මක වීම.<br>○ රාජ්‍යය ත්‍රස්තවාදය.<br>○ සාමය බිඳවැටීම.<br>○ අන්තර් රාජ්‍යය ගැටුම් වර්ධනය වීම.<br>○ පුද්ගලයා අර්ත ශුන්‍ය වීම |

**සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම**

● <u>සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන න්‍යාය මත නිර්මාණය වූ ආණ්ඩුක්‍රම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම වේ. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායෙන් දේශපාලන මතවාදයත් සමාජවාදී න්‍යායෙන් ආර්ථික මතවාදයත් සංකලනය කරගනිමින් නිර්මාණය වන න්‍යාය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය වේ. එම නිසා <u>සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම යන්හි ලක්ෂණ මෙන්ම සමාජවාදී ආණ්ඩුක්‍රමවල ලක්ෂණයන්ද අඩු වැඩි වශයෙන් අන්තර්ගත වේ.</u>

● <u>සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

දෙවන ලෝක මහා සංග්‍රාමයට පශ්චාත් කාලීනව නිර්මාණය වන **III වන ලෝකයේ රාජ්‍යයන්හි ක්‍රියාත්මක වන්නේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන් ය. නිදර්ශනය ලෙස ශ්‍රී ලංකාව, ඉන්දියාව** දැක්විය හැකිය.

● <u>සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයන්ට අදාළ ලක්ෂණ.</u>

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන් තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ලක්ෂණ මෙන්ම සමාජවාදී ආණ්ඩුක්‍රමවල ලක්ෂණ යන ලක්ෂණ වර්ග දෙකම පවතී.

(i) **මහජන ස්වාධිපත්‍යය.**
(ii) **නිදහස් රහස් තරඟකාරී සාධාරණ මැතිවරණ.**
(iii) **බහුපක්ෂ ක්‍රමයක් පැවතීම.**
(iv) **නිදහස් බලපෑම් කණ්ඩායම් පැවතීම.**
(v) **අධිකරණයේ ස්වාධීනත්වය.**
(vi) **නීතියේ ආධිපත්‍යය පැවතීම.**
(vii) **පුරවැසි අයිතිවාසිකම් තහවුරු කිරීම.**
(viii) **ජනමාධ්‍යය නිදහස පැවතීම.**

(ix) **ආර්ථිකය රාජ්‍යය පාලනය යටතේ ක්‍රියාත්මක වීම.**
(x) **ආර්ථික කළමණාකරණයට රාජ්‍යය දැඩිව මැදිහත් වීම.**

● සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක වාසි - අවාසි.

**(N.B. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවල සහ සමාජවාදී ආණ්ඩුක්‍රම වල වාසි අවාසි අඩු වැඩි වශයෙන් මීට අදාළ වේ.)**

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදාහැර ඇති ආකාරය මත.

නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදා හැර ඇති ආකාරය මත ප්‍රධාන කොටස් කිහිපයකට වර්ග කළ හැකිය.

1. **ඒකීය ආණ්ඩුක්‍රම.**
2. **සන්ධීය ආණ්ඩුක්‍රම.**
3. **සහ සන්ධීය ආණ්ඩුක්‍රම.**

### ඒකීය ආණ්ඩු ක්‍රම

● ඒකීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.

ඒකීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම. **මූලිකව** , රාජ්‍යයේ ස්වාධිපත්‍යය බලය තනි මධ්‍යම ආණ්ඩුවක් විසින් ක්‍රියාවට නගයි නම් එය ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. **තවදුරටත්** , රාජ්‍යයක ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන ක්‍රියාත්මක කිරීම තනි මධ්‍යම ආණ්ඩුවක් විසින් සිදු කරයි නම් එය ඒකීය ආණ්ඩුක්‍රමයක් ලෙස නිර්වචනය කළ හැකිය.

● ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අදාළ නිදර්ශන.

ඒකීය ආණ්ඩුක්‍රමයකට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන, **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය - ප්‍රංශ ආණ්ඩුක්‍රමය - ජපන් ආණ්ඩුක්‍රමය - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රය.**

● ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ.

(i) **තනි මධ්‍යම ආණ්ඩුවකට පමණක් බලතල හිමිකර දීම.**

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළ මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායක , විධායක හා අධිකරණ යන ත්‍රිවිධ ආයතන සම්බන්ධ බලතල තනි මධ්‍යම ආණ්ඩුවක් වෙතට ඒකරාශී කර තිබීමයි.

(ii) **පරිපාලනයේ පහසුව සඳහා පලාත් පාලන ආයතන පිහිටුවීම.**

ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අදාළ තවත් මූලික ලක්‍ෂණයක් වන්නේ පරිපාලනයේ පහසුව සඳහා ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරගත් සාමාන්‍ය නීතියක් මගින් පළාත් පාලන ආයතන පිහිටුවා තිබීමයි. එම පලාත් පාලන ආයතන වල බලතල සංශෝධනය කිරීමට , අහෝසි කිරීමට , නැවත පවරාගැනීමට මධ්‍යම ආණ්ඩුවට හැකිය. ඒකීය ක්‍රමයක් තුළ ඇති පළාත් පාලන ආයතනයන්ට නිදර්ශන

නිදර්ශන - **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතනය (කෝරළ සභා - පේරු සභා - වසම් - කෝරළ දිස්ත්‍රික් සභා - කොරනල් සභා)

1978 **ශ්‍රී ලාංකීය ආණ්ඩුක්‍රමය** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතන (නගර සභා - මහනගර සභා - ප්‍රාදේශීය සභා )

**ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** මගින් නිර්මාණය කර ඇති පලාත් පාලන ආයතන (දෙපාර්තමේන්තු - කැන්ටන - කොමියුන )

(iii) **අධිකරණය බලවත් වීමට හෝ නොවීමට හැකි වීම.**

(iv) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත වීමට හෝ නොවීමට හැකි වීම.**

(v) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය වීමට හෝ අනම්‍ය වීමට හැකි වීම.**

(vi) **ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික හෝ ද්වි මාණ්ඩලික වීමට හැකි වීම.**

● ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි - අවාසි.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ කුඩා රාජ්‍යයන් කාර්යක්‍ෂමව පාලනය කිරීමට හැකිවීම.<br>○ බලය කාර්යක්‍ෂම ලෙස ක්‍රියාවට නැගීමට හැකිවීම<br>○ බලය ක්‍රියාවට නංවන්නේ කුමන ආයතනය විසින් දැයි පැහැදිලිව හඳුනාගැනීමට හැකිවීම.<br>○ අර්බුද අවස්ථාවන්ට වඩා හොඳින් මුහුණදිය හැකිවීම.<br>○ ප්‍රාදේශීය අවශ්‍යතා සහ ජාතික අවශ්‍යතා අතර ගැටුම් ඇතිනොවීම.<br>○ පරිපාලන සහ අධිකරණ අංශයන්හි ඒකීයත්වය රැකගැනීමට හැකිවීම. | ○ විශාල භූමියක් කාර්යක්‍ෂමව හා විධිමත්ව පාලනය කිරීමට නොහැකිවීම.<br>○ විශමතා සහිත රාජ්‍යයක් පාලනය සඳහා මෙම ක්‍රමය නොගැලපීම.<br>○ විජාතීය බහුසංස්කෘතික හැඩතල සහිත සමාජයකට මෙය නොගැලපීම<br>○ විවිධ ජන කණ්ඩායම් වල අවශ්‍යතා ඉටු නොවීමට ඇති අවකාශය |

## සන්ධීය ආණ්ඩුක්‍රම

● <u>සංධීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

සංධීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි නිර්වචනය කිරීම. **මූලිකව ,** <u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල බෙදා හැර ඇති ආණ්ඩුක්‍රමය සංධීය ආණ්ඩුක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය.</u> **තවදුරටත් ,** <u>රාජ්‍යයේ ස්වාධිපත්‍යය බලය මධ්‍යය ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු ක්‍රියාවට නගයි නම් එය සංධීය ආණ්ඩුක්‍රමයක් වේ.</u>

● <u>සංධීය ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

සංධීය ආණ්ඩුක්‍රමයන්ට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන , **ඇමරිකානු ආණ්ඩුක්‍රමය - ඉන්දියානු ආණ්ඩුක්‍රමය - ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රමය - කැනඩානු ආණ්ඩුක්‍රමය.**

● <u>සංධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ලක්ෂණ.</u>

(i) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මධ්‍යය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලය බෙදීම.**

සංධීය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවකට අදාළ මූලික ලක්ෂණයක් වන්නේ මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු වලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදීමයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් බලතල විමධ්‍යගත කර තිබීම ලක්ෂණයකි.

(ii) **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය බෙදාහරින්නේ එකිනෙකට වෙනස් ක්‍රම මගිනි.**

බලතල විමධ්‍යගත කිරීමේදී භාවිත කරනු ලබන විධි විධාන සංධීය ක්‍රමයෙන් සංධීය ක්‍රමයට ගතික වේ. ඊට අදාළව **ඉදිරිපත් කල හැකි විධිවිධාන,**

- **ජාතික වශයෙන් වැදගත් අංශ මධ්‍යම ආණ්ඩුවට ද ප්‍රාදේශීය අංශ ප්‍රාන්ත ආණ්ඩුවලට ද පැවරීම.**

  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහැරීමේදී බොහෝ විට විට **ආරක්ෂක - විදේශ කටයුතු - මුදල්** වැනි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති අංශ වල බලතල මධ්‍ය ආණ්ඩුවට හිමිකර දෙන අතර එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලය මධ්‍යම ආණ්ඩුව සතු වේ. බොහෝ විට **කෘෂිකර්ම - සෞඛ්‍යය - ප්‍රවාහන -** අධ්‍යාපන වැනි ප්‍රාදේශීය අංශ වල බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට ලබාදීම. එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලතල ප්‍රාන්ත ආණ්ඩු වලට පවරා දෙයි.

- **ජාතික වශයෙන් වැදගත් අංශ මධ්‍යම ආණ්ඩුවට ද ප්‍රාදේශීය අංශ ප්‍රාන්ත ආණ්ඩුවලට ද පැවරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහැරීමේදී බොහෝ විට විට **ආරක්ෂක - විදේශ කටයුතු** - මුදල් වැනි ජාතික වශයෙන් වැදගත්කමක් ඇති අංශ වල බලතල මධ්‍ය ආණ්ඩුවට හිමිකර දෙන අතර එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලය මධ්‍යම ආණ්ඩුව සතු වේ. බොහෝ විට **කෘෂිකර්ම - සෞඛ්‍යය - ප්‍රවාහන - අධ්‍යාපන** වැනි ප්‍රාදේශීය අංශ වල බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට ලබාදීම. එම අංශ සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ කටයුතු කිරීමට බලතල ප්‍රාන්ත ආණ්ඩු වලට පවරා දෙයි.

- **ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් මධ්‍යම ආණ්ඩුව බලවත් කොට නිර්මාණය කරන අතර ඇතැම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මගින් ප්‍රාන්ත ආණ්ඩු බලවත් කොට නිර්මාණය කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහරින විට මධ්‍යම ආණ්ඩුව බලවත් කොට නිර්මාණය කළ හැකිය. කැනඩානු ආණ්ඩුක්‍රමය මීට අදාළ නිදර්ශනයකි. ඇතැම්විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාන්ත ආණ්ඩු බලවත් කොට නිර්මාණය කළ හැකිය. ඇමරිකානු ආණ්ඩුක්‍රමය මීට අදාළ නිදර්ශනයකි.

- **ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාව මගින් බලතල බෙදාහැරීම සඳහා භාවිතා කරන ක්‍රම තුනකි.**

ඇමරිකානු ක්‍රමය - මධ්‍යම ආණ්ඩුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා නොමැති ශේෂ බලතල සියල්ල ප්‍රාන්ත ආණ්ඩුවලට පැවරීම. මෙහි අරමුණ වන්නේ ශක්තිමත් ප්‍රාන්ත ආණ්ඩු නිර්මාණය කිරීමයි. ඇමරිකාව-ස්විස්ටර්ලන්තය නිදසුන් වේ.

කැනේඩියානු ක්‍රමය - ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල දක්වා දක්වා නොමැති ශේෂ බලතල සියල්ල මධ්‍යම ආණ්ඩුවට පැවරීම. මෙහි අරමුණ වන්නේ ශක්තිමත් මධ්‍ය ආණ්ඩුවක් නිර්මාණය කිරීමයි. නිදසුන් ලෙස කැනඩාව දැක්විය හැකිය.

ඉන්දියානු ක්‍රමය - මධ්‍යය ආණ්ඩුව සතු බලතල ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල මෙම ආණ්ඩු දෙකටම භුක්තිවිඳිය හැකි සමගාමී බලතල වෙන වෙනම දැක්වීම මෙහිදී වුව ද ප්‍රායෝගික තලය තුළදී නිර්මාණය වන්නේ ශක්තිමත් මධ්‍යය ආණ්ඩුවක් ය. ඊට හේතු වන්නේ සමගාමී ලැයිස්තුව සම්බන්ධ යම් අර්බුධයකදී මධ්‍යය ආණ්ඩුව බලවත් වීමයි. නිදසුන් ලෙස ඉන්දියාව දැක්විය හැකිය.

(iii) අධිකරණය බලවත් වීම.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත වීම.

(v) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වීම.

(vi) ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වීම.

● <u>සංඝීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o විශාල රාජ්‍යයන් පාලනයට පහසුවීම. | o රටේ ඒකාබද්ධතාවයට අහිතකරවීම. |
| o විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟ කර ගත හැකිවීම. | o පරිපාලන ඒකීයත්වය ගොඩනගා ගැනීමට අපහසුවීම. |
| o මධ්‍යම ආණ්ඩුවේ අත්තනෝමතික පාලනය මර්ධනය වීම. | o වියදම් අධික ක්‍රමයක්වීම. |
| o කුඩා දුබල රාජ්‍යයන්ට ස්වකීය පැවැත්ම සහතික කරගැනීමට හැකිවීම. | o ද්විත්ව පාලනයන් හේතු කොටගෙන ගැටුම් ඇතිවිය හැකිවීම. |
| o විශමතා සහිත රාජයයන් එම විශමතාවයන්ට ගැළපෙන සේ පාලනය කළ හැකිවීම. | o සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවීමට අපහසුවීම. |
| o රාජ්‍යයන් කිහිපයකට එකම දේශපාලන අරමුණක් ඇති වූ විට එය ළඟ කර ගැනීමට හැකිවීම. | o විවිධත්වය එලෙසම පත්වාගෙන යාම නිසා වාර්ගික ප්‍රශ්න ඉස්මතුවීම. |
| o බහුවිධතාවය සහිත ඒකක එකට එකතු කොට එක් මාධ්‍යයක් බවට පත්කිරීමට හැකියාව. | o කොටස් රාජ්‍යයන්ට වෙන්ව යෑමේ අවකාශය පවතින නිසා දේශපාලන අස්ථාවර භාවයක් ඇතිවිය හැකිවීම. |

## සහසන්ධීය ආණ්ඩුක්‍රම

● <u>සහසන්ධීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක් දැයි හැඳින්වීම.</u>

කිසියම් විශේෂිත විශයන් කිහිපයක් සඳහා සන්ධීය ක්‍රමයට එළඹුණු අනෙකුත් අවස්ථා වලදී ස්වාධීනව ක්‍රියාත්මක වන රාජ්‍යයන් කිහිපයක් සහසංධීය ආණ්ඩුක්‍රමයක් ලෙස හැඳින්විය හැකිය. විශේෂයෙන් ආර්ථික - ආරක්ෂක - විදේශ කටයුතු වැනි විශයයන් සම්බන්ධයෙන් එක්ව කටයුතු කරන අනෙකුත් විෂයයන් සම්බන්ධයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම සහ සංධීය ආණ්ඩුක්‍රම ලෙස හඳුනාගත හැකිය. සරලව දක්වන්නේ නම් **ඒකීය - සංධීය ආණ්ඩු ක්‍රම අතර මැද ස්ථාපනය වී ඇති ආණ්ඩුක්‍රමය සහ සංධීය ආණ්ඩුක්‍රමයක් වේ.**

මෙම ක්‍රමය යටතේ සංධීය ක්‍රමයට එළඹී ඇති රාජ්‍යයන් බැඳී පවතින්නේ සම්මුතියක් (එකඟතාවක්) මත විය හැකි ය. ඇතැම් විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හරහා ද සහසංධීය ක්‍රම ගොඩනැගී තිබිය හැකි ය. නමුත් මෙම බැඳීම ශක්තිමත් බැඳීමක් නොවේ. සමූපාකාර හැඩයක් ගත් සාමාන්‍යය සාමූහිකත්වයක් ලෙස හඳුනාගත හැකි ය.

● <u>සහසංධීය ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

- 1291 - 1847 - දක්වා ස්විස්ටර්ලන්තයේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රමය.
- 1776 - 1789 - දක්වා ඇමරිකාව තුළ ක්‍රියාත්මක වූ සංයුක්ත ආණ්ඩු ක්‍රමය.

- යුරෝපා සංගමය - ස්විස්ටර්ලන්තය හැර යුරෝපා ජාතීන් එකතු වී නිර්මාණය කරගෙන ඇති සංධීය ක්‍රමයකි. මෙම සහසංධීය ක්‍රමයේ මූලික අරමුණ වන්නේ ආරක්ෂක - ආර්ථික - මිතුරු සබැඳියාවන් සම්බන්ධයෙන් සාමූහිකව කටයුතු කිරීමයි.

- <u>සහසංධීය ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| o රාජ්‍යයන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා වීම.<br>o අවශ්‍ය මොහොතක දී අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් පමණක් සංධීය ක්‍රමයක් යටතේ ඒකාබද්ධ වීමට හැකි වීම.<br>o පහසුවෙන් සංධීය ක්‍රමයෙන් ඉවත් වියහැකි වීම.<br>o අරමුණු ජයග්‍රහණය කර ගැනීම සඳහා පමණක් සංධීය ක්‍රමය තුළ ක්‍රියාත්මක විය හැකි වීම. | o ශක්තිමත් බැඳීම් සහිත සංධීය ක්‍රමයක් නොවීම.<br>o සංධීය ක්‍රමය අසාර්ථක වීමට ඇති අවකාශය වැඩි වීම.<br>o සංධීය ක්‍රමයට එළඹෙන රාජ්‍යයන් අතර භූමිය - ජන ගහණය - සම්පත් අතින් සමාන කම් නොතිබීම.<br>o දුර්වල මධ්‍යයම ආණ්ඩුවක් නිර්මාණය වීම. |

## විධායකයේ ස්වරූපය මත

නූතන ජාතික රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම විධායකයේ ස්වරූපය මත ප්‍රධාන කොටස් කිහිපයකට වර්ග කළ හැකිය.

1. **කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම**
2. **ජනාධිපති ආණ්ඩුක්‍රම**
3. **මිශ්‍ර ආණ්ඩුක්‍රම**
4. **ඒක තන්ත්‍ර ආණ්ඩු ක්‍රම**

## කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම

- <u>කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව තුලින් තෝරාගත් අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් විධායක කටයුතු මෙහෙයවන ආණ්ඩු ක්‍රමයක් කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ලෙස සරලව හැඳින්විය හැකිය.

- <u>කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන.</u>

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයන්ට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්ශන ලෙස **බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය - ඉන්දියානු ආණ්ඩුක්‍රමය** දැක්විය හැකිය.

● <u>කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.</u>

(i) **ව්‍යවස්ථාදායක තුලින් විධායකය තෝරා ගැනීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ඇති මූලික ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාධායකය පාර්ලිමේන්තුව තුලින් විධායකය තෝරාගැනීමයි. එම නිසා විධායකය කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථාධායකයේ සාමාජිකයින් බවට ද පත් වේ. පාර්ලිමේන්තුවේ වැඩි දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා නාමික විධායකය විසින් අගමැතිවරයා ලෙස තෝරා පත් කරයි. පසුව අගමැතිගේ උපදෙස් මත ව්‍යවස්ථාධායකය තුලින් අමාත්‍ය මණ්ඩලය තෝරාපත් කරයි. **අගමැති ප්‍රමුඛ ආමාත්‍ය මණ්ඩලය කැබිනට් මණ්ඩලය ලෙස විධායක කටයුතු මෙහෙවයි.** එය දේශපාලන විධායකය, සත්‍යය විධායකය, ක්‍රියාකාරී විධායකය, සැබෑ විධායකය ලෙස දේශපාලන විද්‍යාව තුළ නාමකරණය කරයි.

(ii) **විධායකයන් දෙකක් පැවතීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ඇති තවත් ලක්ෂණයක් වන්නේ විධායකයන් දෙකක් පැවතීමයි. **නාමික විධායකය (නාම මාත්‍රික විධායකය) හා සත්‍ය විධායකය** ලෙස එය වර්ග කළ හැකිය.

■ <u>**නාමික විධායකය,**</u> කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ඇති එක් විධායකයකි. මෙම ආණ්ඩුක්‍රමයේ සියලු විධායක කටයුතු ක්‍රියාත්මක කරන්නේ නාමික විධායකය වන **රාජ්‍යය නායකයාගේ** නාමයෙනි.

නිදර්ශන -: <u>රජු හෝ රැජිනක්</u> නාමික විධායකය බවට පත්වීම.
බ්‍රිතාන්‍ය - ජපානය මෙහිලා නිදසුන් ය.

<u>ජනාධිපතිවරයෙකු</u> නාමික විධායකය බවට පත් වීම.
ඉන්දියානු ආණ්ඩුක්‍රමය මීට අදාළ නිදර්ශනයකි.

<u>අග්‍රාණ්ඩුකාරවරයෙකු</u> නාමික විධායකය බවට පත්වීම.
ඔස්ට්‍රේලියාව - කැනඩාව - නවසීලන්තය - 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය නිදසුන් ය.

■ <u>**සත්‍ය විධායකය,**</u> මෙය **දේශපාලන විධායකය** - සැබෑ **විධායකය** - **ක්‍රියාකාරී විධායකය** - යන නාමකරණයන්ගෙන් හඳුන්වයි. එය සමන්විත වන්නේ **අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයෙනි.** අගමැතිවරයා **ආණ්ඩුවේ නායකයා** වේ.

(iii) **ව්‍යවස්ථාධායකයේ ආධිපත්‍යයක් පැවතීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක තවත් ලක්ෂණයක් වන්නේ නෛතික (නීතිමය) තලය තුලදී ව්‍යවස්ථාදායකයේ ආධිපතිත්වයක් පැවතීමයි. විධායකය ව්‍යවස්ථාධායකය තුළින් තෝරාපත් කරයි.

එම නිසා පාලන කටයුතු සම්බන්ධයෙන් විධායකය වන කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට **සාමූහිකව වගකිව යුතු ය**. එසේ වග නොකියන විට ව්‍යවස්ථාධායකය තුළ සම්මතකරනු ලබන **විශ්වාස භංග යෝජනාවක්** මගින් විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය. මේ අනුව විධායකයේ ආයුකාලය තීරණය කරනු ලබන්නේ ව්‍යවස්ථාදායකය විසිනි. තවත් සරල කරනුයේ නම් ව්‍යවස්ථාදායකයේ කැමැත්ත තිබෙනතාක් කල් පමණක් විධායකයට ධූර දැරීමට හැකිය. **මේ අනුව නීතිමය තලය තුළ ව්‍යවස්ථාධායකයේ ආධිපතිත්වයක් පැවතීම ලක්ෂණයකි.**

(iv) **ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමට විධායකයට හැකි වීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක තවත් ලක්ෂණයක් වන්නේ ව්‍යවස්ථාදායකය **කැඳවීම - කල්දැමීම - විසුරුවා හැරීම** විධායකය සතු කර තිබීමයි. දේශපාලන විධායකය විසින් එය තීරණය කරයි. එය ක්‍රියාත්මක කරනු ලබන්නේ නාමික විධායකය විසිනි.

(v) **පාර්ලිමේන්තුවට වැදගත් ස්ථානයක් හිමිවීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුවට ඉතා වැදගත් ස්ථානයක් හිමි වෙයි. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලෙස නාමකරණය කිරීම තුලින්ම එය ප්‍රත්‍යක්ෂ වේ. එසේම විධායකය නීතිමය තලය තුළ ව්‍යවස්ථාධායක පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටීම තුළින් ද එය තවදුරටත් තහවුරුවේ. එමෙන්ම විධායකය - ආණ්ඩුපක්ෂ සහ විරුද්ධ පක්ෂය යන අවයව තුන මුණ ගැසෙන ස්ථානය බවට පත් වන්නේ ද පාර්ලිමේන්තුවයි. මෙම හේතු නිසා පාර්ලිමේන්තුව මෙම ආණ්ඩුක්‍රමය තුළ වැදගත්ම ආයතනය වේ.

(vi) **අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවේ සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත වීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ ආමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තු තුලින් තෝරාපත් කර ගැනීමෙනි. පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලය තුළින් අමාත්‍ය වරුන් විශාල ප්‍රමාණයක් තෝරා ගන්නා අතර දෙවන සභාව තුළින් ද අමාත්‍යවරු කිහිප දෙනෙක් අමාත්‍යය මණ්ඩලය සඳහා තොරාගනී. මේ අනුව අමාත්‍ය මණ්ඩලය තුළ සිටින්නේ පාර්ලිමේන්තුවේ මණ්ඩල දෙක තුළ සිටින සාමාජිකයන් ය.

(vii) **රාජ්‍යය නායකයා විසින් ආණ්ඩුවේ නායකයා තෝරා පත් කිරීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායකයන් දෙකක් පවතී. එනම්, නාමික විධායකය හා දේශපාලන විධායකය වශයෙනි. **නාමික විධායකය රාජ්‍යය නායකයා වේ.** රාජ්‍ය නායකයා විසින් පාර්ලිමේන්තුවේ වැඩිම දෙනාගේ විශ්වාසය දිනාගත් මන්ත්‍රීවරයා අගමැතිවරයා ලෙස තෝරාපත් කරයි. **අගමැතිවරයා යනු ආණ්ඩුවේ නායකයාය.** එම නිසා රාජ්‍යය නායකයා විසින් ආණ්ඩුවේ නායකයා තෝරාගැනීම ලක්ෂණයකි.

(viii) **විධායකය සාමූහික මණ්ඩලයක් ලෙස කටයුතු කිරීම.**

කැබිනට් ආණ්ඩුක්‍රමයක තවත් වැදගත් ලක්ෂණයක් වන්නේ විධායකය සාමූහික මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමයි. මෙයින් අදහස් වන්නේ තමන්ගේ පෞද්ගලික මතවාදය කුමක් වුවත් කැබිනට් මණ්ඩලයක් වශයෙන් බහුතරය විසින් ගනු ලබන තීරණයට එකඟවිය යුතු බවයි. එසේ එකඟ නොවන අමාත්‍යවරයෙක් සිටී නම් ඔහු අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලා අස්විය යුතු ය. එසේ ඉල්ලා අස්නොවන අමාත්‍යවරයෙකු කැබිනට් මණ්ඩලයේ සාමූහිකත්වය පවත්වාගෙන යාමට බාධාවක් ලෙස සලකා ඉවත්කිරීමට අගමැතිවරයාට හැකි ය. මෙම තත්ත්වය මත කැබිනට් අමාත්‍යවරු සාමූහික මණ්ඩලයක් වශයෙන් කටයුතු කිරීම කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණයකි. එසේම කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට ද සාමූහිකව වගකිව යුතුය.

(ix) **බලවත් අගමැතිධූරයක් පැවතීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දැකිය හැකි තවත් ලක්ෂණයක් වන්නේ බලවත් අගමැති ධූරයක් පැවතීමයි. පක්ෂ ක්‍රමයේ වර්ධනයත් සමඟ මෙසේ බලවත් අගමැතිධූරයක් නිර්මාණය වී තිබේ. නූතනය තුළ අගමැතිවරයා බලවත් වීම නිසා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම, **අගමැති ආණ්ඩුක්‍රම ලෙස** නාමකරණය කිරීමට ද දේශපාලන විචාරකයින් පෙළඹී තිබේ.

(x) **විරුද්ධ පක්ෂයට වැදගත් ස්ථානයක් හිමිවීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක පැවැත්ම සඳහා තිබිය යුතු වැදගත් කොන්දේසියක් වන්නේ **ශක්තිමත් ආණ්ඩුපක්ෂයක් මෙන්ම ශක්තිමත් විරුද්ධ පක්ෂයක** අවශ්‍යය තාවයයි. කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විරුද්ධ පක්ෂය හඳුන්වනු ලබන්නේ **ජාතියේ මුරබල්ලා** යන නාමකරණයෙනි. බ්‍රිතාන්‍යය තුල එය **රැජිනගේ මීලග ආණ්ඩුව** ලෙස නාමකරණය කරයි. විරුද්ධ පක්ෂයේ කාර්යය විය යුත්තේ, **ආණ්ඩුව ප්‍රතිඵල දායි අන්දමින් විවේචනය කරමින් අත්තනෝමතික හැසිරීම් පාලනය කිරීම - විරුද්ධ පක්ෂය නිසාම සෑම දෙයකටම විරුද්ධ නොවී විරුද්ධ විය යුතු අවස්ථාවේ විරුද්ධ වීමත් සහය දැක්විය යුතු අවස්ථාවේ සහය දැක්වීමත් - ආණ්ඩුව බිඳ වැටුනහොත් මීලග ආණ්ඩුව නිර්මාණය කිරීමට සූදානමින් සිටීමත්ය.**

(xi) **දේශපාලන පක්ෂ ක්‍රමයක අවශ්‍යතාවය.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක තවත් ලක්ෂණයක් වන්නේ දේශපාලන පක්ෂ ක්‍රමයක අවශ්‍යතාවයක් පැවතීමයි. කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හඳුන්වනු ලබන්නේ **පක්ෂ ආණ්ඩුවක් ලෙසය.** එමගින්ම දේශපාලන පක්ෂවල ඇති වැදගත් භාවය තීරණය වේ. **කැබිනට් ආණ්ඩුක්‍රම හා දේශපාලන පක්ෂ හඳුන්වනු ලබන්නේ එකම කාසියක දෙපැත්ත ලෙසය.** දේශපාලන පක්ෂ නොමැතිව කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය පවත්වාගෙන යාමට නොහැකිය. විශේෂයෙන් මෙම ආණ්ඩුව ද්විපක්ෂ ක්‍රමයක් තුළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක වේ.

- <u>කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක හඳුනාගත හැකි වාසි - අවාසි.</u>

## <u>වාසි (වැදගත්කම) - යහපත්භාවය</u>

### ප්‍රජාතාන්ත්‍රිකභාවයෙන් වැඩි වීම.

ලෝකයේ දැනට ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම අතරින් ප්‍රජාතාන්ත්‍රික භාවයෙන් වැඩිම ආණ්ඩුක්‍රමය වන්නේ කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයයි. ජනාධිපතික්‍රමයක මෙන් ඒකපුද්ගල ආධිපතිත්වයක් මෙහිදී මතු නොවේ. කැබිනට් පාර්ලමේන්තු ආණ්ඩුක්‍රමයක අගමැතිවරයාගේ නායකත්ව බලය දැඩිව ක්‍රියාත්මක උව ද එය ජනාධිපති ක්‍රමයක ජනාධිපතිවරයාගේ බලය තරම් භයානක දෙයක් නොවේ. ඊට හේතුව වන්නේ කැබිනට් මණ්ඩලය තුළ අගමැතිවරයා තරම්ම බලවත් ජනප්‍රිය අමාත්‍යවරුන් සිටීමය. අනෙක් කරුණ වන්නේ අගමැතිවරයා නිරන්තරව අත්තනෝමතිකව හැසිරෙන්නේ නම් ඔහු පාලනය කිරීමට ජ්‍යෙෂ්ඨ සහ ප්‍රබල අමාත්‍යය වරුන්ට හැකිවීමයි. මෙම තත්ත්වය මත කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය වඩාත් ප්‍රජාතාන්ත්‍රික ස්වභාවයක් නිරූපණය කරයි.

### වගකීම් සහිත විධායකයක් නිර්මාණය කිරීම.

විධායකය පාලන කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකීමට බැඳී තිබීම කැබිනට් ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයකි. එසේ වගනොකියන විට ව්‍යවස්ථාදායකය තුළ විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය. මෙම තත්ත්වය මත නිර්මාණය වන්නේ වගකීම් සහිත ආණ්ඩුවක් ය.

### මහජන මතයට වඩාත් සංවේදී ආණ්ඩුවක් වීමයි.

විධායකයන් ව්‍යවස්ථාදායකය තුළ පවතින නිසා පාර්ලිමේන්තුව මගින් ජනතා මතය හඳුනාගැනීම. ජනතාවගේ දුක්ගැනවිලි හඳුනාගැනීමට විධායකයට හැකිවීම. තවදුරටත් කැබිනට් අමාත්‍යය වරයෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ද වේ. එම නිසා ඔහු පාර්ලිමේන්තුවට පතිකර එවූ ඡන්ද දායකයන් සම්බන්ධයෙන් සොයා බැලීමට කැබිනට් අමාත්‍යය වරයෙකුට සිදුවේ එසේ නොමැති වූ විට මීළඟ මැතිවරණයේදී ජනතාව ඔහුන් නැවත පාර්ලිමේන්තුවට පත් නොකරයි. එම නිසා මෙම ආණ්ඩු වලට මහජන මතයට වඩාත් හොඳින් සංවේදී වීමට සිදුවේ.

### පාලන බලතල නිරන්තයෙන් දේශපාලන ප්‍රවීනයන් විසින් ක්‍රියාවට නැගීම.

සාමාන්‍යයෙන් අගමැතිවරයෙකු බවට පත්වන්නේ විශාල කාලයක් දේශපාලන ක්ෂෙත්‍රයේ නියැලී සිටි මන්ත්‍රීවරයෙකි. එසේම කැබනට් අමාත්‍යයවරුන් බවට පත්වීම සඳහා ද දීර්ඝකාලයක් දේශපාලන ක්ෂෙත්‍රයේ නියැලීමට ද සිදුවේ. එමනිසා කැබිනට් මණ්ඩලය සකස් වන්නේ දේශපාලන ප්‍රවීනයන්ගෙනි.

## <u>අවාසි (දුර්වලතා) - අයහපත්භාවය</u>

### අකාරක්ෂමතාවයෙන් යුක්තවීම.

තීරණගැනීම සහ ක්‍රියාත්මක කිරීමට විශාල කාලයක් ගතවීම නිසා කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ජනාධිපති ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව අකාරයක්ෂම ආණ්ඩුක්‍රමයක් ලෙස දේශපාලන විචාරකයින් පෙන්වා දෙයි.

- **කැබිනට් මණ්ඩලය තුළ ඒකාධිපති පාලනයක් බිහිවීමට ඇති හැකියාව**

තනි පක්ෂයකින් කැබිනට් මණ්ඩලය නිර්මානය වූ විටත් , නියත බහුතර බලයක් ව්‍යවස්ථාදායක පාර්ලිමේන්තුව තුළින් විධායකයට ඇති විටත් කැබිනට් මණ්ඩලයේ අත්තනෝමතික චලනයන් වැළැක්විය නොහැකිය. මෙවැනි තත්ත්වයක් තුළ සිදුවන්නේ කැබිනට් මණ්ඩලය විසින් පාර්ලිමේන්තුව පාලනය කිරීමයි. එසේම ව්‍යවස්ථාදායකයේ සාමාන්‍ය මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය ද මෙවැනි තත්ත්වයක් තුළ පහළ වැටේ. දේශපාලන වාචාරකයින් ප්‍රකාශකරනු ලබන ආකාරයට සාමාන්‍යය මන්ත්‍රීවරුන් බල විරහිත සිග්නල් කණු බලය පත් වේ. මෙම ආකාරයට කැබැනට් මණ්ඩලය තුළ ඒකාධිපති පාලනයක් බිහිවීමට ඇති හැකියාව මෙම ආණ්ඩුක්‍රමයේ ඇති දුර්වලතාවයකි.

- **අස්ථාවර ආණ්ඩු නිර්මාණය වීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක අස්ථාවර ආණ්ඩු නිර්මාණය විය හැකිය. දේශපාලන පක්ෂ මත ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමයක්වීම නිසා ආණ්ඩුක්‍රමය අස්ථාවරවීමේ හැකියාව පවතී. එය ආකාර දෙකකට පැහැදිලි කර දිය හැකිය. ව්‍යවස්ථාදායකය තුළ ආණ්ඩුවට ස්ථාවර බහුතරයක් නොමැති විට ද - සභාග ආණ්ඩු නිසා ද අස්ථාවර ආණ්ඩු නිර්මාණය වීමේ අවකාශය පවතී.

- **පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය තුළ අමාත්‍යවරුන් මහජන නියෝජිතයන් වන නිසා තමන්ට පැවරෙන අමාත්‍යාංශ පරිපාලනය කිරීමට වඩා ඔවුන් දේශපාලයේ නියැලීමට වැඩි උනන්දුවක් දැක්වීම.**

අමාත්‍යවරුන් අමාත්‍යාංශවල කටයුතු වල නිරතවනවාට වඩා දේශපාලනයේ නිරතවීම නිසා අමාත්‍යාංශ තුළ නිලධාරීවාදය ඉතා දැඩිව ඉස්මතුවෙයි. මෙහි ප්‍රතිඵලය වන්නේ නිලධාරීන් තමන්ට අවශ්‍යය ආකාරයට කටයුතු කිරීමට පෙළඹීමයි.

- **ජාතික ආශාවන් අභිබවා පටු පක්ෂ ආශාවන් ඉස්මතුවීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන පක්ෂ වැදගත්වේ. එම නිසා දේශපලඥයින් විසින් ස්වකීය පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් තම ඡන්ද දායකයන් තෘප්තිමත් කිරීමට අදාළව ක්‍රියාත්මක වන වා මිසක් ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් මැදිහත්වීමක් සිදු නොවේ.

- **රටේ දේශපාලනය නිරන්තරයෙන්ම දැඩි උණුසුම් ස්වභාවයක් ගැනීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන පක්ෂ අතිශයින් වැදගත් වේ. පක්ෂයට හිමි ජනතා ආකර්ෂණය ආරක්ෂාකර ගැනීම සඳහා ආණ්ඩු පක්ෂය මෙන්ම විරුද්ධ පක්ෂය ද අඛණ්ඩ අරගලයක යෙදී සිටී. එම නිසා කුමන්ත්‍රණ - ප්‍රතිකුමන්ත්‍රණ - පාවාදීම් - බෙලිකපා ගැනීම් - චෝදනා - ප්‍රතිචෝදනා වලින් පිරීගිය නොනවතින බල අරගලයක් මේ තුළ ක්‍රියාත්මක වේ. ඒ නිසා රටේ දේශපාලනය නිරන්තරිකව උණුසුම් අරගලමය ස්වභාවයක් ගනී. එය දුර්වලතාවයකි.

## ජනාධිපති ආණ්ඩුක්‍රම

- <u>ජනාධිපති ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.</u>

ව්‍යවස්ථාදායකයට පරිබාහිරව තෝරාගත් ජනාධිපතිවරයෙකු විධායක බලය ක්‍රියාවට නගන ආණ්ඩුක්‍රමයක් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ලෙස සරලව නිර්වචනය කළ හැක.

- <u>ජනාධිපති ආණ්ඩුක්‍රම සම්බන්ධයෙන් පළවී ඇති දාර්ශනික නිර්වචන</u>

> **"විධායක බලතල සියල්ල ජනාධිපති තනතුර වෙත ඒකරාශී කරන ලද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් යොදන ලද විධිවිධාන මගින් ව්‍යවස්ථාදායකයේ බලපෑමෙන් නිදහස් කරන ලද, ස්වාධීන පැවැත්මක් සහිත තමාගේ දේශපාලන ප්‍රතිපත්ති වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට වග නොකියන ආණ්ඩුක්‍රමයක් වේ."**
>
> -ගානර්-

- <u>ජනාධිපති ආණ්ඩුක්‍රමයන්ට අදාළ නිදර්ශන</u>

ජනාධිපති ආණ්ඩුක්‍රමයක් සඳහා ලෝක දේශපාලනය තුලින් සැපයිය හැකි ශක්තිවන්ත නිදර්ශනය වන්නේ **ඇමරිකානු ආණ්ඩුක්‍රමය යි.**

- <u>ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණ</u>

(i) **තනි විධායකයක් පැවතීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක පවතින්නේ එක් පූර්ණ විධායකයක් පමණි. ඒ ජනාධිපතිවරයා ය. විධායක බලය ක්‍රියාවට නැංවීමේ තනි උරුම කරුවා ඔහු ය. මෙවැනි ආණ්ඩුක්‍රමයක **ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ නායකයා ද වේ.**

(ii) **ව්‍යවස්ථාදායකය හා විධායකය වෙන වෙනම තෝරා ගැනීම.**

ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් වෙනම මැතිවරණයකින් ද විධායක ජනාධිපතිවරයා වෙනම මැතිවරණයකින් ද තෝරා ගනී. මේ ආකාරයට ව්‍යවස්ථාදායකය හා විධායකය වෙන වෙනම මැතිවරණ මගින් තෝරා පත්කර ගැනීම ලක්ෂණයකි.

(iii) **විධායකයේ ආධිපත්‍යයක් පැවතීම.**

විධායකය ඍජුව ජනතාව විසින් තෝරාපත් කරගැනීම ලක්ෂණයකි. එම නිසා කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමයක මෙන් ව්‍යවස්ථාදායකයට වගකීමට විධායකය බැඳී නොමැත. එම නිසා විශ්වාසභංග යෝජනාවකින් විධායක ජනාධිපති ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකිය. ඒ සඳහා දෝෂාභියෝග චෝදනාවක් සම්මත කිරීමට ව්‍යවස්ථාදායකයට සිදුවේ.

එය එතරම් පහසු ක්‍රියාවලියක් නොවේ. එම නිසා කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමයකට සාපේක්‍ෂව විධායකයේ ආධිපත්‍යයක් පැවතීම ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්‍ෂණයකි.

(iv) **විධායකය සාමූහික මණ්ඩලයක් නොවීම.**

ජනාධිපති ක්‍රමයක ජනාධිපතිට උපදේශක මණ්ඩලයක් පවත්වාගත හැකිය. එය කැබිනට් ලේකම් මණ්ඩලය ලෙස හඳුන්වයි. නමුත් මෙය කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමයක කැබිනට් මණ්ඩලයට සමාන ආයතනයක් නොවේ. ජනාධිපති ආණ්ඩුක්‍රමයක් තුළ ජනාධිපතිවරයා සාමූහික මණ්ඩලයක් ලෙස විධායක කටයුතු ක්‍රියාත්මක නොකරයි. නමුත් ජනාධිපතිට උපදේශක මණ්ඩලයක් සිටිය හැකි මුත් ඔවුන් දෙන උපදෙස් පිළිගැනීමට ජනාධිපතිවරයා බැඳී නොමැත. එම නිසා විධායකය සාමූහික මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක නොවීම ලක්‍ෂණයකි.

(v) **විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොමැතිවීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොමැත. එසේම ව්‍යවස්ථාදායකය කැඳවීමට - කල්දැමීමට - විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය නොමැත. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර දුරස්ථ සම්බන්ධතාවයක් නිරූපණය වේ.

(vi) **බලබෙදීමේ සිද්ධාන්තය ක්‍රියාත්මක වීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක් සංවිධානය කිරීමේදී ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ යන ත්‍රිවිධ ආයතන අතර බලතල බෙදා දැක්වීම හඳුනාගත හැකිය. මේ සඳහා බලතල බෙදීමේ න්‍යාය භාවිත කරයි.

(vii) **සංවරණ තුලන සිද්ධාන්තය ක්‍රියාත්මකවීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක ඇති තවත් ලක්‍ෂණයක් වන්නේ සංවරණ හා තුලන සිද්ධාන්තය ක්‍රියාත්මක වීමයි. මින් බලාපොරොත්තු වන්නේ ත්‍රිවිධ ආයතන ක්‍රියාත්මක වීමේදී එකිනෙකින් පාලනය කිරීමයි.

● <u>ජනාධිපති ආණ්ඩුක්‍රමයක වාසි - අවාසි</u>

**වාසි (වැදගත්කම) - යහපත්භාවය**

- **කාර්යක්‍ෂමතාවයෙන් යුක්ත වීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක ඇති ප්‍රධාන වාසිය වන්නේ කාරයක්‍ෂම ආණ්ඩුවක් නිර්මාණය වීමයි. ඉක්මනින් තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට විධායක ජනාධිපතිවරයෙකුට හැකිය. විධායකය සාමූහික මණ්ඩලයක් නොවීම සහ ව්‍යවස්ථාදායකයට වග කීමට බැඳී නොමැතිවීම ආණ්ඩුවේ කාර්යක්‍ෂම භාවයට බලපාන ප්‍රධාන හේතු වේ.

- **ස්ථාවර ආණ්ඩු නිර්මාණය වීම.**

ස්ථාවර ආණ්ඩු නිර්මාණය වීම මෙහි ඇති ප්‍රධාන වාසියකි. ශක්තිමත් විධායකයක් පැවතීම - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොතිබීම - විධායකය පහසුවෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට නොහැකිවීම වැනි හේතු නිසා ස්ථාවර ආණ්ඩුවක් නිර්මාණය වේ.

- **හදිසි අවස්ථාවන්ට හා දේශපාලන අර්බුදවලට වඩාත් ශක්තිමත් ලෙස මුහුණදීමට හැකිවීම.**

- **බහු පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රාජ්‍යයන්ට වඩාත් යෝග්‍ය වීම.**

බහු පක්ෂ ක්‍රමයක් පවතින රාජ්‍යයන්හි නිර්මාණය වන්නේ බොහෝ විට අස්ථාවර විධායකයකි. ඊට හේතුව වන්නේ විධායකය පක්ෂ කිහිපයකින් නිර්මාණය වීමයි. කැබිනට් ක්‍රමය තුළ බහු පක්ෂ ක්‍රමයක් යටතේ නිර්මාණය වන්නේ සභාග ආණ්ඩු වේ. සභාග ආණ්ඩු නියත ලෙසම අස්ථාවර වේ.

- **දේශපාලන පක්ෂ ක්‍රමයේ ක්‍රියාකාරීත්වයට වැදගත් තැනක් නොලැබීම.**

කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව ජනාධිපති ආණ්ඩුක්‍රමයකට දේශපාලන පක්ෂ ක්‍රමය එතරම් වැදගත් නොවේ. ජනාධිපති ආණ්ඩුක්‍රමයක දේශපාලන පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක නොවීමේ වාසිය වන්නේ රටේ දේශපාලනය පරිස්සම්කාරී වීමයි.

<u>අවාසි (අවැදගත්කම) - අයහපත්භාවය</u>

- **ප්‍රජාතාන්ත්‍රික භාවයෙන් අඩුවීම.**

කැබිනට් ආණ්ඩුක්‍රමයකට සාපේක්ෂව ජනාධිපති ආණ්ඩුක්‍රමය ප්‍රජාතාන්ත්‍රික භාවයෙන් අඩුය. ඊට බලපෑ හේතු , ස්ථාවර තනි විධායකයක් පැවතීම - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී නොමැති වීම - විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකය නොහැකිවීම. මෙම හේතු නිසා විධායකය අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක වෙයි. එම නිසා ජනාධිපති ක්‍රමය ප්‍රජාතාන්ත්‍රික ස්වභාවයෙන් අඩු ය.

- **විධායකය හා ව්‍යවස්ථාධායකය අතර ගැටුම් ඇති වීමට හැකිවීම.**

විධායකය වෙනම පත්වීමත් ව්‍යවස්ථාදායකය වෙනම තේරීපත්වීමත් නිසා මෙම ආයතන දෙක අතර සම්බන්ධතාවය සමීප නොවේ. එම නිසා මෙම ආයතන දෙක අතර ගැටුම් ඇති වීමේ අවකාශය වැඩිය.විශේෂයෙන් විධායකයත් - ව්‍යවස්ථාදායකයත් එකිනෙකට විරුද්ධ පක්ෂ දෙකකින් නිර්මාණය වී ඇති මොහොතක ගැටුම් ඇතිවීමේ සම්භාවිතාව වැඩිය.

- **ව්‍යවස්ථාදායකයේ තත්ත්වය දුර්වල වීම.**

මෙයට හේතුව වන්නේ ව්‍යවස්ථාදායකය නොසලකා හරිමින් විධායකයට ක්‍රියාත්මක වීමට හැකිවීමයි.

- **විරුද්ධ පක්ෂයේ තත්ත්වය හීනවීම.**

- **දේශපාලන පක්ෂ ක්‍රමය පොදුවේ ක්‍රියාත්මක නොවීම.**

මෙම පක්ෂක්‍රමය සක්‍රීයව ක්‍රියාත්මක නොවීම නිසා ජනතාවගේ සුබසාධන කටයුතු ඉටුවීමේ ප්‍රවනතාවය මන්දගාමී විය හැකිය.

## මිශ්‍ර ආණ්ඩුක්‍රම

● **මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.**

ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණනත් කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණත් මිශ්‍රව ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් වේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් විධායක බලය **ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක්** විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් එය මිශ්‍ර ආණ්ඩු ක්‍රමයකි. මේ අනුව විධායක බලය ක්‍රියාවට නැගීම සඳහා විධායකයන් දෙකක් පවතී.

● **මිශ්‍ර ආණ්ඩුක්‍රමයකට අදාළ නිදර්ශන.**

මිශ්‍ර ආණ්ඩුක්‍රමයකට අදාළව ඉදිරිපත් කළ හැකි ශක්තිවන්ත නිදර්හනය ලෙස **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය - 1958 ප්‍රංශ ආණ්ඩුක්‍රමය** දැක්විය හැකිය.

● **මිශ්‍ර ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.**

(i) **විධායකය කොටස් දෙකකින් යුක්ත වීම.**

මිශ්‍ර ආණ්ඩුක්‍රමයක ඇති ප්‍රධානම ලක්ෂණය වන්නේ විධායකයන් දෙකක් පැවතීමයි. ජනාධිපති ආණ්ඩුක්‍රමක මෙන් වෙනමම තෝරාගන්නා ජනාධිපතිවරයෙක් ද? කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක මෙන් ව්‍යවස්ථාධායකය තුලින් තෝරාගන්නා අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයක් ද යන විධායකයන් දෙකකින් යුක්තවීම. මෙහිදී බලවත්වන්නේ ජනාධිපතිවරයාය.

(ii) **විධායකය ව්‍යවස්ථාදායකයට වගකීම.**

විධායකයන් දෙකක් පවතින නිසා මෙය මෙසේ විග්‍රහ කළ යුතු ය. ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකය තුළින් තේරීපත් නොවන නිසා මොහු ව්‍යවස්ථාදායකයට වග කීමට බැඳී නැත. නමුත් අගමැති සහ අමාත්‍ය මණ්ඩලය ව්‍යවස්ථාදායකය. තුලින් තේරීපත් වන නිසා ව්‍යවස්ථාදායකයට වග කීමට බැඳී සිටී. එම නිසා එසේ වගනොකියන විට ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරන විශ්වාස භංගයෝජනාවක් මගින් අගමැති සහ අමාත්‍ය මණ්ඩලය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකිය. **නමුත් විශ්වාස භංග යෝජනාවකින් ජනාධිපති වරයා ඉවත් කළ නොහැකිය. ඒ සඳහා ව්‍යවස්ථාදායකය තුළ දෝශාභියෝග චෝදනාවක් සම්මත කළ යුතු ය.**

(iii) **ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමට විධායකයට බලතල තිබීම.**

මිශ්‍ර ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය කැඳවීමට - කල්දැමීමට - විසුරුවා හැරීමට බලතල ජනාධිපතිවරයා සතු කර තිබීම ලක්ෂණයකි.

● **මිශ්‍ර ආණ්ඩුක්‍රමයක වාසි - අවාසි.**

**(N.B)** ජනාධිපති හා කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමවල වාසි හා අවාසි මීට අදාළ වේ. මෙම මිශ්‍ර ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කරගනු ලබන්නේ ජනාධිපතික්‍රමයක් තුළ ප්‍රධානතම වාසිය වන කාර්යක්ෂමතාවයන් කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ප්‍රධානම වාසිය වන ප්‍රජාතන්ත්‍රවාදී භාවයක් ඇති කිර ගැනීම සඳහාය.

## ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රම

● ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හැඳින්වීම.

මෙම ආණ්ඩුක්‍රම ඒක පුද්ගල තන්ත්‍ර ආණ්ඩුක්‍රම ලෙස ද හඳුන්වයි. එක් පුද්ගලයෙකු විසින් විධායක බලය ක්‍රියාවට නංවන්නේ නම්, සරලව එය ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක් ලෙස නිර්වචනය කළ හැකිය. රාජාණ්ඩු - හමුදා පාලන මීට අදාළ නිදර්ශන ලෙස සටහන් කළ හැකි මුත් මෙහි දී අවධානය යොමු කරනු ලබන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් තුළ ක්‍රියාත්මක වන ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රම සම්බන්ධයෙනි.

● ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයකට අදාළ නිදර්ශන.

ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ශක්තිවන්ත නිදර්ශනය වන්නේ වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමයයි. මෙහි ජනාධිපති වරයා ඒක තන්ත්‍රයක් ලෙස නිර්මාණය කර තිබේ.

● ඒක තන්ත්‍ර ආණ්ඩුක්‍රමයක ලක්ෂණ.

(i) **පලකයා ජනතාව තෝරාපත් කර ගැනීම. නමුත් බලයට පැමිණි පසු පාලකයා ආඥාදායක ස්වරූපයෙන් ක්‍රියාත්මක වීම.**

(ii) **පාලකයාට ආකර්ශනීය නායකත්වයක් තිබීම.**

(iii) **රාජ්‍යය සංකීර්ණ ප්‍රශ්න වලට මුහුණදී තිබීම.**

(iv) **බලය බේදීම ශක්තිමවත්ව භාවිත කර නොතිබීම.**

(v) **සංවරණ තුලන සිද්ධාන්තය ශක්තිමත්ව භාවිත කොට නොතිබීම.**

(vi) **නීතියට යටත් නොවූ පාලනය (හිතුවක්කාරී පාලනය)**

(vii) **බලපෑම් කණ්ඩායම් එතරම් වැදගත් නොවීම.**

(viii) **මහජන මතය එතරම් වැදගත් නොවීම.**

(ix) **ප්‍රබල සංවිධානාත්මක ඔත්තු සේවාවක් පවත්වා ගැනීම.**

● ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයක වාසි - අවාසි.

| වාසි (වැදගත්කම) | අවාසි (දුර්වලතා) |
|---|---|
| ○ ශක්තිමත් ආණ්ඩුක්‍රමයක් නිර්මාණය වීම.<br>○ කාර්යක්ෂමතාවය ඉතා ඉහළ වීම.<br>○ රාජ්‍යය සංවර්ධනය කිරීමට පහසුවීම.<br>○ හදිසි තත්ත්වයක දී නොසැලී එයට මුහුණදීමට පාලකයාට හැකි වීම. | ○ ප්‍රජාතන්ත්‍රවාදී භාවයනේ අඩු ආණ්ඩුක්‍රමයක් වීම<br>○ ජනතාවගේ නිදහස අයිතිවාසිකම් සීමාවීම.<br>○ ආඥාදායක පාලකයන් බිහිවීම.<br>○ විධායකය ව්‍යවස්ථාදායකයට වග නොකීම.<br>○ වගකීම් විරහිත ආණ්ඩුක්‍රමයක් වීම. |